www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ සන්නද්ධ කල්ලියක් රූපවාහිනී හා ගුවන් විදුලි මධ්‍යස්ථානයට ගිනිතබයි

## Armed mob sets fire to Sri Lankan TV/radio station

පානිනී විජේසිරිවර්ධන විසිනි

2010 අගෝස්තු 11

ජූලි 30 දා හිමිදිරියේ කොළඹ මධ්‍යයේ පිහිටි සියත රූපවාහිනී/ගුවන්විදුලි මධ්‍යස්ථානයට කඩාවැදුනු සන්නද්ධ කල්ලියක් එම පරිශ්‍රයට ගිනි තැබී ය. එහි දී ආයතනයේ සේවකයන් දෙදෙනෙක් සහ ආරක්ෂක භටයෙක් තුවාල ලැබූහ. මෙම ප්‍රහාරය ආරක්ෂක හමුදාව සමග සහයෝගීව ක්‍රියාකරන ආන්ඩුවට ගැති මැරකල්ලි විසින් ගෙනයනු ලබන ප්‍රචන්ඩත්වයේ හා බියවැද්දීමේ අඛන්ඩ ක්‍රියාදාමයක තවත් එකකි. සිද්ධිය පිලිබඳ "පුලුල් පරීක්ෂනයන්" සිදු කෙරෙන බව පොලීසිය ප්‍රකාශ කල ද මෙතෙක් කිසිවෙක් අත්අඩංගුවට ගෙන නැත.

සියත කලමනාකාරීත්වය කියන පරිදි ටී-56 ස්වයංක්‍රීය ගිනිඅවි වලින් සන්නද්ධ මුහුනු ආවරනය කරගත් මිනිසුන් 12ක් පමන මෝටර් රථ දෙකකින් පැමින උදෑසන 1.30ට පමන මාධ්‍ය සංකීර්නයට කඩාවැදී ඇත. ආරක්ෂක භටයාට සහ තවත් සේවකයන් දෙදෙනෙකුට පහර දීමෙන් පසු මෙම කල්ලිය ප්‍රධාන මැදිරියට පෙට්රල් බෝම්බ ගසා ගිනිතැබූ අතර අනෙකුත් තැන්වලට හානි කරන ලදී. රුපියල් මිලියන 50කට (එක්සත් ජනපද ඩොලර් 445,000ක් පමන) ආසන්න යයි ගනන්බලා ඇති හානියක් සිදුකරමින් කැමරා සහ අනෙකුත් උපකරන මෙම ප්‍රහාරයේ දී විනාශ කර ඇත.

ලෝක සමාජවාදී වෙබ් අඩවිය (ලෝසවෙඅ) වෙත අදහස් දක්වමින් සියත ප්‍රවෘත්ති කලමනාකාර උදිතමාල් හේමචන්ද්‍ර, තමන්ට රූපවාහිනී විකාශන ආරම්භ කල නො හැකිවී ඇතත් ගුවන්විදුලි නාලිකා තුන දැන් ක්‍රියාත්මක වන බව පැවසීය.

සියත ගොඩනැගිල්ල පිහිටා තිබෙන්නේ පැය විසිහතර පුරාම දැඩි ලෙස සන්නද්ධ හමුදා භටයින් විසින් මුරකරනු ලබන අධිආරක්ෂිත කලාපයක ය. මෙම ප්‍රහාරය සිදුවූයේ ජනාධිපති මහින්ද රාජපක්ෂගේ නිලනිවස වන අරලියගහ මන්දිරයට මීටර් කිහිප සියයක් දුරින් වීම අර්ථභාරීය. කෙසේ වෙතත් සන්නද්ධ කල්ලියකට සියත පරිශ්‍රයට වාහනවලින් පැමින ප්‍රහාරය සිදුකොට බාධාවකින් තොරව ප්‍රදේශයෙන් පලායාමට හැකිවීමේ අර්ථය වන්නේ සිද්ධිය ආරක්ෂක හමුදාවල අනුදැනුමකින් තොරව සිදුවිය නො හැකි බව යි.

ප්‍රහාරය සිදුවූ විනාඩි 20 ඇතුලත සියත කලමනාකාරීත්වය දුරකථනයෙන් පොලිස් හදිසි සේවා අංශය ඇමතීය. සියත පරිශ්‍රයට ආසන්නතම පොලිස් ස්ථානය කිලෝමීටරයකටත් අඩු දුරකින් පිහිටා තිබුනත් පොලීසියට එහි ලඟාවීමට පැයක් පමන ගත විය. ආයතනයේ සම අයිතිකාර රොෂාන්ත කාරියප්පෙරුම ප්‍රකාශ කලේ ගින්න පිලිබඳව දැනුම් දීමෙන් පසුව ගිනි නිවන හමුදාවට මැදිරියට පැමිනීමට විනාඩි 35ක් පමන ගතවූ බව යි.

පොලීසිය අගෝස්තු 2දා උසාවියට කියා සිටියේ ඔවුන් තවමත් කිසිදු සැකකරුවෙක් හඳුනාගෙන නොමැති බව හා විමර්ශන දිගටම සිදුවෙමින් පවතින බව ය. රට තුලත් ජාත්‍යන්තරවත් සිද්ධිය හෙලාදකින අතරතුර සිද්ධිය විමර්ශනය කිරීමට පොලිස් කන්ඩායම් දෙකක් යොදවා ඇති බව මාධ්‍ය ඇමති කෙහෙලිය රඹුක්වැල්ල ප්‍රකාශ කලේය. එහෙත් මාධ්‍යවලට එරෙහිව මීට පෙර සිදුකල ප්‍රචන්ඩ ක්‍රියාවන්හිදී මෙන් ම මෙහිදී ද වගකිව යුතු මැරකල්ලිය අත්අඩංගුවට ගැනීම හෝ ඔවුන්ට එරෙහිව පියවර ගැනීම සැක සහිතය.

"සිය ප්‍රහාරය සිදු කොට මුරපොලවල් වලින් ගහන. මිලිටරි හා පොලිස් සන්නද්ධ භටයන් විසින් දැඩි ලෙස රැකවල් ලා ඇති නගරයෙන් ලෙහෙසියෙන්ම පලාගිය ආකාරය" අවධානයට ලක්කරමින් කතුවැකියක් ලිවූ දක්ෂිනාංශික අයිලන්ඩ් පුවත්පත පවා සියත වෙත එල්ල වූ ප්‍රහාරය පිලිබඳ සිය "තිගැස්ම සහ කනස්සල්ල" පල කලේ ය.

ජනාධිපති රාජපක්ෂ ධූරයට පත් වූ තැන් පටන් ගෙවී ඇති වසර පහ පුරා ආරක්ෂක හමුදාවල අනුග්‍රහය යටතේ ක්‍රියාත්මක ආන්ඩුවට ගැති ඝාතක කල්ලි හා මැර කන්ඩායම්, රටෙහි දෙමල සුලුතරයට, මාධ්‍යවලට හා දේශපාලන විරුද්ධවාදීන්ට එරෙහිව සිදුකල සිය ගනන් පැහැරගෙන යාම්, ඝාතන, හා ප්‍රචන්ඩ ප්‍රහාරවලට වගකිව යුතු වෙති. දීර්ඝ සිවිල් යුද්ධය 2009 වසරේ මැයි මාසයේ බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානයේ (එල්ටීටීඊ) පරාජයෙන් අවසන්වූ පසුව ද මැර ක්‍රියා නො කඩවා සිදු වී තිබේ.

සියත, ආන්ඩුව පිලිබඳව විවේචනශීලී වූ මාධ්‍ය ජාලයක් නොවීය. එහි අයිතිකරුවන් වන ජනප්‍රිය නිලි සංගීතා වීරරත්න, ඇයගේ සැමියා වන රොෂාන්ත කාරියප්පෙරුම සහ ඔහුගේ සොහොයුරු ප්‍රියන්ත කාරියප්පෙරුම ජනාධිපති රාජපක්ෂ සහ ඔහුගේ සහෝදරයන්ගේ සමීප මිතුරෝ ය. පුලුල්ව පිලිගැනෙන පරිදි ප්‍රියන්ත ලබාදුන් සහයෝගයට කල ප්‍රත්‍යුපකාරයක් වශයෙන් ඔහු විදුලි-සංදේශ නියාමන කොමිසමේ ප්‍රධානියා ලෙස පත්කරන ලදී.

එහෙත් ජනවාරි මස ජනාධිපතිවරන සමයේ රාජපක්ෂවරුන් සහ කාරියප්පෙරුම සහෝදරවරුන් අතර සබඳතා නොපිටට පෙරලුනි. සන්ඩේ ටයිම්ස් පුවත්පත සඳහන් කල පරිදි කාරියප්පෙරුමලා ප්‍රතිවාදී ජනාධිපති අපේක්ෂක හිටපු හමුදාපති සරත් ෆොන්සේකාට සහයෝගය දෙන්නේ යයි එක් රාජපක්ෂ සහෝදරයෙක් චෝදනා කලේය. ප්‍රියන්ත කාරියප්පෙරුමට නියාමන කොමිසමේ තනතුරෙන් ඉල්ලා අස්වන ලෙස දන්වනු ලැබූ අතර සියත මාධ්‍ය ජාලයේ පුවත්පතකට ආන්ඩුව ලබාදුන් පුවත්පත් දැන්වීම් නතර කලේ එය වසාදැමීමට බල කරමිනි.

සියත ප්‍රවෘත්ති "සැමවිට ම අපක්ෂපාත සහ සාධාරන" බව සන්ඩේ ලීඩර් පුවත්පතට කියාසිටි වීරරත්න "කිසිවෙකුට තමන්ට හානිකිරීමේ අවශ්‍යතාවක් තිබේ යයි විශ්වාස කිරීමට හේතුවක් නැතැයි" කියා සිටියා ය. නම් නො කල "තරගකරුවෙක්" පිලිබඳව සැක පලකල ඇය වැඩිදුර තොරතුරු හෙලි නො කලා ය. සත්‍ය වසයෙන් ම ප්‍රතිවාදියෙක් මෙයට සම්බන්ධ වියහැකි වුවත් මෙවැනි සාහසික ප්‍රහාරයක් ආන්ඩුවේ කොටස්වල හා ආරක්ෂක හමුදාවල පිටුබලයකින් තොරව සිදු කල නො හැකිය.

සිය විවේචකයන් මර්දනය කිරීම පිලිබඳව රාජපක්ෂ තන්ත්‍රය කුප්‍රකට ය. දැනට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වන ජෙනරාල් ෆොන්සේකා එල්ටීටීඊයට එරෙහිව ගෙනගිය කුරිරු යුද්ධයේ දී හමුදාපති ලෙස ජනාධිපති රාජපක්ෂ සමග සමීපව වැඩ කලේ ය. එල්ටීටීඊයේ පරාජයෙන් පසුව තරමක් ඇත්වූ ෆොන්සේකා ජනාධිපති සමග නෝක්කාඩු වීමෙන් පසුව ජනාධිපතිවරනයේ දී විපක්ෂ අපේක්ෂකයෙක් ලෙස තරග වැදුනි. මැතිවරනයෙන් දින ගනනකට පසු ෆොන්සේකා කුමන්ත්‍රනයක් සැලසුම් කරමින් සිටියේ ය යන ආන්ඩුව එල්ල කල අභූත චෝදනා යටතේ අත්අඩංගුවට ගන්නා ලදී. ගොතන ලද චෝදනා කිහිපයක් පිලිබඳ නඩුවලට මුහුන දෙමින් ඔහු තවමත් මිලිටරි අත්අඩංගුවේ පසු වේ.

ඉහල පෙලේ තවත් එවන් සිද්ධියක දී සන්ඩේ ලීඩර් පුවත්පතේ හිටපු කර්තෘ ලසන්ත වික්‍රමතුංග වැඩට යමින් සිටිය දී 2009 ජනවාරි මාසයේ මහදවල් ඝාතනය කරන ලදී. ඔහු ද කලක් රාජපක්ෂගේ සගයෙක්ව සිට පසුව විවේචකයෙක් සහ දේශපාලන විරුද්ධවාදියෙක් බවට පත්වූවෙකි. ප්‍රදේශයේ පැවති දැඩි ආරක්ෂක රැකවල් මධ්‍යයේ පවා ඔහුගේ ඝාතකයෝ පලායාමට සමත් වූහ. ඔහුගේ ඝාතනය පිලිබඳව මෙතෙක් කිසිවෙකුටත් චෝදනා එල්ල කොට නැත.

වික්‍රමතුංගගේ ඝාතනයට ආසන්න දිනකදී මුහුනු ආවරන සහිතව පැමිනි 20දෙනෙකුගෙන් පමන සමන්විත සන්නද්ධ කල්ලියක් හිමිදිරියේම එම්ටීවී/සිරස මාධ්‍ය ජාලයේ ගොඩනැගිල්ලට කඩාවැදී ආරක්ෂකයන් මැඩපවත්වා ගොඩනැගිල්ල විනාශ කලහ. එහි දී පාලක මැදිරියට, කාර්යාලවලට සහ ඡායාගතකිරීමේ මැදිරිවලට පුලුල් පරිමානයෙන් හානි කරන ලදී. ක්ෂනිකව දුරකථන ඇමතුම් ලබා දුන්න ද විනාඩි 30 පැවති ප්‍රහාරය අවසන් වන තුරු පොලීසිය පැමිනියේ නැත. ප්‍රහාරය සිදුවූයේ රාජ්‍ය මාධ්‍ය ආන්ඩුවේ යුද්ධය පිලිබඳව එම්ටීවී/සිරස ජාලයේ "දේශමාමක නො වන" ආකල්පය හෙලාදකින ප්‍රචාරයන් ගෙනයාමෙන් පසුවය.

පසුගිය වසර පහ පුරා මාධ්‍යවලට එරෙහි ප්‍රචන්ඩ ප්‍රහාර මාලාවක් සිදු වී ඇති අතර අවම වසයෙන් මාධ්‍යකරුවන් 14 දෙනෙක් ඝාතනය කර තිබේ. ජනවාරි මස ජනාධිපතිවරනය ආසන්නයේ ලංකා ඊ නිව්ස් වෙබ් අඩවියේ මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ අතුරුදහන් වූ අතර එතැන් සිට ඔහුව දැකගැනීමට ලැබී නැත. විරුද්ධ පක්ෂයේ ජනතා විමුක්ති පෙරමුනෙහි (ජවිපෙ) පුවත්පත වන ලංකා පත්‍රයේ කර්තෘ චන්දන සිරිමල්වත්ත අත්අඩංගුවේ රඳවා තැබුනු අතර ඔහු නිදහස් කලේ අධිකරනය හමුවට යාමෙන් පසුව පමනි.

ජනාධිපති රාජපක්ෂ අධිකරනයට බලපෑම් කලේ යයි සඳහන් වුනු ලිපියක් ජුනි 27දා පලකිරීම නිසා දැන් උසාවියට අපහාස කලේය යන චෝදනාව සිරිමල්වත්තට එරෙහිව එල්ල කොට තිබේ. ලංකා පත්‍රය කියා සිටියේ පාලක සභාගයේ ආධාරකරුවෙකු වන අල්ලස් නඩුවක චූදිතයෙක් නිදහස් කරන ලෙස දන්වා ජනාධිපති සහකාර ලේකම්වරයෙක් අධිකරන සේවා කොමිසමට ලිපියක් යවා ඇති බව යි.

සියත ආයතනය වෙත එල්ල වූ ප්‍රහාරය, රාජපක්ෂ ආන්ඩුව ඉතා සීමිත දේශපාලන විරුද්ධත්වයක් පවා නො ඉවසන බව සිහිපත් කරන තවත් සිදුවීමකි. එය ඉලක්ක කර ඇත්තේ දැනටමත් බෙහෙවින් හීලෑකොට තිබෙන මාධ්‍ය සංස්ථාපිතය බියවැද්දීමය. මෙම ප්‍රහාරය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් නියමකර තිබෙන කප්පාදු පියවර ආන්ඩුව විසින් ක්‍රියාවට දමන තතු තුල එයට එරෙහිව නැගෙන ඕනෑම විරෝධයක් මැඩීමට යොදාගනු ඇති පොලිස් රාජ්‍ය ක්‍රමවේදය පිලිබඳව කම්කරු පන්තියට කෙරෙන අනතුරු ඇඟවීමක් ද වේ.

© www.wsws.org